ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
ආයතනික අධ්‍යයන දෙපාර්තමේන්තුව
විද්‍යාවේදී / අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව
තුන්වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2024
ඔබගේ කාර්යය සහ සේවකයින් කළමනාකරණය කිරීම - MSU3208/OSU3208
කාලය : පැය (02) දෙකයි

| | |
|---|---|
| දිනය : 06 දෙසැම්බර් 2024 | වේලාව : පෙ.ව.09.30 - පෙ.ව.11. 30 |

උපදෙස්

- ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.
- පිළිතුර විධිමත් ලෙස අදාළ ප්‍රශ්නයට කේන්ද්‍රගත කළ යුතුය.

01. අ ) කළමනාකරණයේදී පාලනය යනු කුමක්දැයි අර්ථ නිරූපනය කරන්න. (ලකුණු 10)

ආ) කර්මාන්තයකට (Manufacturing organization) තම ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා යොදා ගත හැකි පාලන විධි කවරේදැයි උදාහරණ සමග පැහැදිලි කරන්න. (ලකුණු 15)

02. "නායකත්වයේ ඵලදායිතාවය නිගමනය කළ යුත්තේ නායකයකුගේ ගති ලක්ෂණ මත පමණක් නොව, යටත් සේවකයන්ගේ ගති ලක්ෂණ සහ පැවරෙන කාර්යයන් අනුව බවද අධ්‍යයනයන් මගින් පෙන්වා දී ඇත".
නායකත්වය පිළිබඳ චර්යාමය න්‍යායන් (Behavioral theories) ගේ වැදගත්කම විදහා දක්වමින් මෙම ප්‍රකාශය පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 25)

03. අතීතයේ සිට වර්තමානය තෙක් වර්ධනය වෙමින් පැවත ආ, ව්‍යාපාර ආයතනයන්හි ක්‍රියාත්මක වන කළමනාකරණ ප්‍රවේශයන් (Management approch) ලුහුඩින් පැහැදිලි කරන්න. (ලකුණු 25)

04. ඔබ දන්නා ව්‍යාපාර ආයතනයක නෙවන පෙල කළමනාකරුවෙකු ලෙස ඔබට පත්වීමක් ලැබුනේ යැයි උපකල්පනය කරන්න. ඔබගේ දෙපාර්තමේන්තුවේ සේවකයින් අභිප්‍රේරණය කිරීම මගින් එම දෙපාර්තමේන්තුවේ ඵලදායිතාවය බෙහෙවින් ඉහල දැමිය හැකි බව ඔබට පෙනී ගියේ යැයිද සලකන්න.

අ ) අභිප්‍රේරණය (Motivation) යන්නෙන් කුමක් අදහස් කෙරේද? (ලකුණු 10)

ආ) ඔබ පාලනයට නතු වන කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය කිරීම සඳහා හර්ෂ්බර්ග් ද්විසාධක න්‍යාය (Herzberg's two factor theory) භාවිතා කළ හැකි අයුරු දක්වන්න (ලකුණු 15)

05 අ ) "පරිසරයේ සිදුවන සංකීර්ණ වෙනස්කම් වලට මුහුණ දීම සඳහා සෑම ආයතනයක්ම තම ක්‍රියාකාරකම් සැලසුම් කළ යුතුය".

සැලසුම් කිරීම යනු කුමක්ද සහ ආයතන කළමනාකරණය කිරීමේදී එහි වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ) ඔබේ උපාධි පාඨමාලාවේ 3 මට්ටම් විභාග සම්පූර්ණ කිරීමෙන් පසු කුඩා පරිමාණ නිෂ්පාදන/සේවා සංවිධානයක් ආරම්භ කිරීමට ඔබ අපේක්ෂා කරන බව උපකල්පනය කරන්න.

ඔබේ ව්‍යාපාරය ආරම්භ කිරීමට අවශ්‍ය ඔබේ ක්‍රියාකාරකම් සැලසුම් කරන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න (ලකුණු 15)

06 පහත සඳහන් දෑ පිළිබඳව කෙටි සටහන් ලියන්න

අ ) සම්පූර්ණ තත්ත්ව කළමනාකරණය (Total Quality Management) (ලකුණු 05)
ආ) මිනිස් බලය ඇද ගැනීම (Attracting Manpower) (ලකුණු 05)
ඇ) කළමනාකරුවකුගේ භූමිකා (Roles of a Manager) (ලකුණු 05)
ඈ) සංවිධානයක සන්නිවේදන ජාලයන් (Communication Networkers) (ලකුණු 05)
ඉ) ආයතනික ව්‍යුහයන් (Organizational Structures) (ලකුණු 05)

(මුළු ලකුණු 25)

- හිමිකම් ඇවිරිණි -